The Journal of Archaeology and Heritage Studies (JAHS) 10 (I) 2023: 62-73 pp

The Journal of
ARCHAEOLOGY & HERITAGE STUDIES
Journal Home page http://fssh.rjt.ac.lk/index.php/jahs/

Research Paper

# ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ පවතින මල්වර චාරිත්‍ර පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (අම්පාර දිස්ත්‍රික් පදියතලාව, උහන හා පොල්ලෙබැද්ද ප්‍රදේශ ඇසුරෙන්)

**ලක්මිණි ගමගේ[1*], බී.එම්.එම්.එන්. ගුණසේකර[2]**

[1*] ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ,විශ්වවිද්‍යාලය, මාතර. lakmini24@gmail.com

[2] උපාධිධාරී, ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ, විශ්වවිද්‍යාලය, මාතර.

**සංක්ෂේපය**

අස්පර්ශයීය උරුමයක් ලෙස සැලකෙන මල්වර චාරිත්‍රය පුරාතනයේ සිට පැවත එන්නෙකි. දැරිවියක වැඩිවියට පත්වීමේ දී පැවැත්වෙන මෙම චාරිත්‍රය ප්‍රදේශයෙන් ප්‍රදේශයට මෙන්ම එකම ප්‍රදේශයක වුවද විවිධ විශ්වාසයන් අනුව වෙනස්කම් හඳුනාගත හැකිය. මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ පවතින මල්වර චාරිත්‍රවල සුවිශේෂතා හඳුනා ගැනීමයි. එහි දී මූලික අධ්‍යයන ප්‍රදේශ වශයෙන් අම්පාර දිස්ත්‍රික්කයෙහි පදියතලාව, පොල්ලෙබැද්ද හා උහන යන ප්‍රදේශ තෝරා ගැණුනි. එකිනෙකට වෙනස් ප්‍රදේශ තුනක් කේන්ද්‍රයන් වශයෙන් තෝරා ගැනීම තුළින් විවිධත්වයෙන් යුතු දත්ත රැස්කර ගැනීමට අපේක්ෂා කරනු ලැබුණි. මෙම පර්යේෂණය ගුණාත්මක දත්ත විශ්ලේෂණයකි. ප්‍රාථමික හා ද්විතීය මූලාශ්‍රය යන දෙවර්ගයම භාවිතයට ගැනුණි. තනි පුද්ගලයින් සමග කෙරෙන ගැඹුරු සාකච්ඡා (In-depth Interviews) සහ ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා ක්‍රමය (Focus Group Discussions) අනුගමනය කරනු ලැබුණි. එක්රැස් කළ කරුණු තේමාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රමය (Thematic Analysis Method) ඔස්සේ විශ්ලේෂණය කරනු ලැබුණි. මෙම පර්යේෂණයට අනුව ශ්‍රී ලංකාවේ අම්පාර දිස්ත්‍රික්කය තුළ මල්වර සිරිත් විරිත් කැපී පෙනෙන අයුරින් ක්‍රියාත්මක වන බව හඳුනා ගැනුණි. නමුත් ඒවා කාලානුරූපව යම් යම් වෙනස්කම්වලට භාජනය වී ඇත.

**මුඛ්‍ය පද: අම්පාර, අස්පර්ශයීය උරුමය, ඓතිහාසික, මල්වර චාරිත්‍ර**

ARTICLE INFO

*Article history:*
Received 11 January 2024
Accepted 06 May 2024
Available online 15 July 2024

## 1. හැඳින්වීම

රටක අස්පර්ශනීය උරුමයන් එක් පරම්පාවකින් තවත් පරම්පරාවකට ශක්තිමත් කිරීම සහ සම්ප්‍රේෂණය කිරීම මගින් රටක සංස්කෘතික අනන්‍යතාව හැඩ ගැස්වේ. අස්පර්ශනීය උරුමයන් සමාජයේ ක්‍රියාත්මක වන ආකාරය හා උරුමයන් වශයෙන් ඒවා දීර්ඝ කාලීනව පවතින ආකාරය පිළිබඳව ප්‍රජාව පදනම් කරගත් විද්‍යාත්මක ප්‍රවේශයන් (Community Based Approaches) ඔස්සේ සාකච්ඡා වී තිබේ. උදාහරණ වශයෙන් එල්. ස්මිත්, ජී. ඩේවිස්, ආර්.පී. ස්චිච්ඩ්, ටී.වී. හෆේස්ටීන් යන ශාස්ත්‍රීය පර්යේෂකයන් අස්පර්ශනීය



JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

උරුමයන් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා අදාළ සමාජයෙහි ප්‍රජාවට ඇති පූර්ණ අයිතිය අවධාරණය කරන අතර ඒ සඳහා ජනතාවගේ ඍජු මැදිහත්වීමේ අවශ්‍යතාවද පෙන්වා දී තිබේ (Smith, 2006; Devis, 2011; Schmidt, 2017; Hafestein, 2018). අස්පර්ශනීය උරුමයන් අතර මල්වර චාරිත්‍රවලට හිමි වනුයේ සුවිශේෂිත ස්ථානයකි.

මල්වර චාරිත්‍ර හා ඒ සම්බන්ධ සිරිත් විරිත් පරපුරෙන් පරපුරට සම්ප්‍රේෂණය වීම හරහා එම සමාජය තුළ එකී සිරිත් විරිත් සංස්කෘතික උරුමයක් වශයෙන් ආරක්ෂා වීම සහ ස්ථාවර වීම සිදු වේ. ඒ වගේම මෙම චාරිත්‍ර චාරිත්‍ර සාමූහික සහභාගීත්වය යටතේ සිදු කෙරෙන නිසා පුද්ගලයන් අතර බැඳීම් ඇති කරන අතර සාමූහික සංස්කෘතික අනන්‍යතා ශක්තිමත් කරමින් ප්‍රජාවක සමාජ ඒකාබද්ධතාව සහ සමාජ ව්‍යුහය ශක්තිමත් කරයි. මල්වර චාරිත්‍ර හා ඒ සම්බන්ධ චර්යා සම්මතයන් ඔස්සේ රටක බාල පරම්පරාවට තමන් ජීවත් වන සමාජීය සන්දර්භය තුළ ඔවුන්ගේ භූමිකාව, වගකීම් හා බැඳීම් පිළිබඳ අවබෝධය වර්ධනය කර ගැනීමට අවස්ථාව ලැබේ. මල්වර චාරිත්‍ර සංකේත හා සංකේතාත්මක ක්‍රියාවලියන්ගෙන් පොහොසත් අස්පර්ශනීය උරුමයකි. උදාහරණ වශයෙන් සංස්කෘතික වැදගත්කමක් ඇති ඇඳුම් පැළඳුම්, චාරිත්‍ර චාරිත්‍රල උත්සව හා වස්තූන් වැනි සංකේතාත්මක අංග බොහෝ විට මේ තුළ අන්තර්ගතව පවතී. මෙම සංකේත සංස්කෘතික අනන්‍යතාවය නියෝජනය කරන අතරම අදාළ සංස්කෘතියට අයත් දෘශ්‍ය සහ අත්දැකීම් සලකුණු ලෙස සේවය කරයි. ඒ වගේම මල්වර චාරිත්‍ර ඔස්සේ අදාළ දැරිය තුළ පරිණතභාවයට තමන්ගේ ඇති සූදානම සහ වැඩිහිටි භූමිකාවන් හා වගකීම් දැරීමට තමන්ගේ ඇති යෝග්‍යතාවය පිළිබඳ අවබෝධය වර්ධනය කරයි. විවිධ සංස්කෘතික ප්‍රජාවන් සිටින රටවල මල්වර චාරිත්‍ර විවිධත්වය ප්‍රදර්ශනය කරමින් රටක සමස්ත සංස්කෘතික භූ දර්ශනයට දායක වෙමින් ක්‍රියාත්මක වේ. එකී විවිධ සංස්කෘතික අංග රටක පොදු සංස්කෘතික අනන්‍යතාවයට දායක වෙමින් සංස්කෘතික ඉවසීම සහ අවබෝධය ප්‍රවර්ධනයට උපස්ථම්භක වේ. මේ අනුව මල්වර චාරිත්‍ර යනු ඕනෑම සමාජයක සංස්කෘතික අනන්‍යතාව තහවුරු කෙරෙන ප්‍රධාන අංගයකි. මේ නිසාම විවිධ සමාජවල මල්වර චාරිත්‍ර චාරිත්‍ර හා ඒ සම්බන්ධ සුවිශේෂතා මුල්කර ගත් උපසංස්කෘතින් අධ්‍යයනය කිරීමට විවිධ විද්‍යාර්ථීන් පෙළඹීම සුවිශේෂ ලක්ෂණයකි.

**1.1 සාහිත්‍ය විමර්ශණය**

ලෝකයේ විවිධ සංස්කෘතික සන්දර්භ පදනම් කරගෙන මල්වර චාරිත්‍ර පිළිබඳ අධ්‍යයනයන් සිදු වී ඇත. මෙම අධ්‍යයනයන් ඔස්සේ මල්වර චාරිත්‍රවල අන්තර්ගත සංස්කෘතික, සමාජීය,මනෝවිද්‍යාත්මක සහ මානව විද්‍යාත්මක පර්යාවලෝකනයන් පිළිබඳව අවබෝධයක් ලබාගත හැකිය. උදාහරණ වශයෙන් එච්.මීඩ් සැමෝවාහි තරුණියන්ගේ වැඩිවියට පත්වීමට අදාළ චාරිත්‍ර හා සංස්කෘතික භාවිත විමර්ශනය කරයි. මෙය මානව විද්‍යාත්මක අධ්‍යයනයකි (Mead, 2016). වී.ටනර් සැම්බියාවේ ජනතාව අතර පවතින මල්වර චාරිත්‍ර පිළිබඳ මානව විද්‍යාත්මක අධ්‍යයනයක නිරත වෙමින් එම චාරිත්‍රවල සංකේතාත්මක අර්ථයන් හා සමාජ ක්‍රියාකාරකම් පරීක්ෂා කරයි (Turner, 1982). ඕ.නනේමෙකා අප්‍රිකානු කාන්තාවන් වැඩිවියට පත්වන විට සිදු කරනු ලබන චර්මච්ඡේදනය පිළිබඳව විවේනාත්මක විමර්ශනයක නිරත වේ. එමෙන්ම මෙම අධ්‍යයනය එම චාරිත්‍රය වටා ඇති සංකීර්ණතා ගවේෂණය කරන අතර බටහිර සංජානන මැදිහත්වීම් වලට අභියෝග බරයි (Nnaemeka, 2005). මෙවැනි විදේශීය අධ්‍යයනයන්ට අමතරව මල්වර චාරිත්‍ර තේමා කරගත් ශ්‍රී ලාංකික සන්දර්භයන් පදනම් කරගත් අධ්‍යයනයන්ද සැලකිය යුතු ප්‍රමාණයක් සිදු වී තිබේ. එච්.ආර්.ගොම්බ්‍රිච් මල්වර චාරිත්‍රය සඳහා වටිනා ඓතිහාසික සන්දර්භයක් සපයන අතර ග්‍රාමීය ලංකාවේ පැවති මල්වර චාරිත්‍රයෙහි ආගමික පසුබිම විශ්ලේෂණය කරයි (Gombrich, 2017). ජී.පෙරේරා මල්වර සිරිත් විරිත් සිංහල තරුණ පරපුරට කරන බලපෑම පිළිබඳ අවධාරණය යොමු කරයි. මෙම චාරිත්‍රය තරුණ පරම්පරාවට මනෝවිද්‍යාත්මක මෙන්ම සමාජීය වශයෙන් බලපාන ආකාරය මෙම අධ්‍යයනය ඔස්සේ සාකච්ඡා කර ඇත (Perera, 2005). පී.එච්.කිම් සිංහල සමාජයේ පවතින මල්වර චාරිත්‍ර පිළිබඳ සංසන්දනාත්මක අධ්‍යයනයක යෙදී ඇත (Kim, 2011). එහිදි මූලිකව සිංහල බෞද්ධ සමාජයෙ සහ සිංහල ක්‍රිස්තියානී ප්‍රජාව තුළ ක්‍රියාත්මකවන මල්වර චාරිත්‍ර පිළිබඳ තුලනාත්මක විග්‍රහයක යෙදී ඇත (ibid. 2011).


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

එච්.ජයසූරිය ශ්‍රී ලංකාවේ මල්වර චාරිත්‍ර පිළිබඳව සමාජවිද්‍යාත්මක හා මානව විද්‍යාත්මක අධ්‍යයනයක යෙදී ඇත (Jayasooriya, 2013). මෙහිදී ප්‍රධාන වශයෙන් මල්වර උත්සව පිළිබඳව ඍජු අවධානයක් යොමු කර ඇත. එසේම ඩී. වින්ස්ලෝ විවිධ ආගමික සංකල්ප මත පදනම් වෙමින්, විවිධ ජනවාර්ගික කන්ඩායම් අතර පවතින මල්වර චාරිත්‍රවල විවිධතා විවරණය කර ඇත (Winslow, 1980). රත්නපාල (2021) මල්වර චාරිත්‍ර හා බැඳුණු සංස්කෘතිය පිළිබඳ අවධානය යොමුකර ඇත. දිසානායක (2004) කොටහළු යාග, කොටහළු කවි, පුද්ගල ජීවිතයේ කිලි අවස්ථා පිළිබඳ විශේෂයෙන් සාකච්ඡා කර ඇත. කළුතන්තිරි (2018) මල්වර නැකැත්, මල්වර නැකැත් පලාපල හා ජෝතිෂ්‍ය කටයුතු පිළිබඳ විශේෂ අවධානයක් යොමුකර ඇත. එසේම (ජයතිලක සහ තවත් අය 2021) කොටහළු යාගය පිළිබඳ අවධානය යොමුකර ඇත. එසේම (ජයතිලක, 2011) වැදි ජන ප්‍රජාව හා සම්බන්ධ මල්වර චාරිත්‍ර පිළිබඳ අවධානය යොමුකර ඇත. මෙම පර්යේෂණය හරහා මල්වර සිරිත් විරිත් පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක් ඉදිරිපත් කරන අතර එහි වැදගත්කම, පරිණාමය සහ සිංහල සමාජය කෙරෙහි ඇති බලපෑම පිළිබඳ අවධානය යොමුකර ඇත.

ඉහත විග්‍රහ කළ ආකාරයට ශ්‍රී ලංකාවේ හා ලෝකයේ විවිධ සමාජ මුල්කරගෙන සිදුකෙරෙන මල්වර චාරිත්‍ර හා ඒ හා සම්බන්ධ සංස්කෘතික අංග පිළිබඳව දේශීය විදේශීය අධ්‍යයන රාශියක් සිදු වී තිබේ. විවිධ සමාජවල සිදු කෙරෙන මල්වර චාරිත්‍ර බොහෝ විට එකිනෙකට වෙනස් ය. ඒ ඒ සමාජවල පවතින සංස්කෘතික නිර්ණායක ඊට හේතු වී ඇත. සමහර අවස්ථාවල පොදු සංස්කෘතික සන්දර්භයක් පවතින රටක් වුවත් විවිධ ප්‍රදේශවල මල්වර චාරිත්‍ර මුල්කර ගෙන විවිධ චාරිත්‍ර වාරිත්‍ර ක්‍රියාත්මක වේ. ශ්‍රී ලංකාව පිළිබඳව සලකා බැලුවොත් ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාත මුල්කර ගෙන සිදු කෙරෙන මල්වර චාරිත්‍ර පිළිබඳව පූර්ව අධ්‍යයනයක් සිදුවී නොමැත. මේ නිසා මෙම අධ්‍යයනය ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ සිදු කෙරෙන මල්වර චාරිත්‍රවල සුවිශේෂ ලක්ෂණ අධ්‍යයනය කිරීම උදෙසා සිදු කෙරෙන ගවේෂණාත්මක විශ්ලේෂණයකි. මෙහි පර්යේෂණ ගැටලුව වන්නේ ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ සිදු කෙරෙන මල්වර චාරිත්‍රවල හඳුනාගත හැකි සුවිශේෂ ලක්ෂණ මොනවාද යන්න අධ්‍යයනය කිරීමයි.

## 2. පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය ගුණාත්මක දත්ත විශ්ලේෂණයකි. දත්ත එක්රැස් කිරිම සඳහා ක්ෂේත්‍ර නිරීක්ෂණය ඔස්සේ දත්ත අත්පත්කර ගැනීම හා ද්විතීය මූලාශ්‍ර අධ්‍යයනය කිරීම යන ක්‍රම දෙකම භාවිත කරනු ලැබිය. ද්විතීය මූලාශ්‍රය ලෙස විවිධ පර්යේෂණ ග්‍රන්ථ හා පර්යේෂණ ලිපි සමීක්ෂණය කරනු ලැබීය. අදාළ ක්ෂේත්‍රය වශයෙන් තෝරා ගනු ලැබූයේ අම්පාර දිස්ත්‍රික්කයේ පදියතලාව, පොල්ලේබැද්ද, උහන යන ප්‍රදේශයි. අම්පාර දිස්ත්‍රික්කයේ මෙම ප්‍රදේශ ත්‍රිත්වය එකිනෙකට වෙනස් උපලක්ෂණ පෙන්වන ගම්මාන තුනක් වශයෙන් හඳුනාගත හැකිය. ප්‍රධාන වශයෙන් පදියතලාව ග්‍රාමීය ලක්ෂණ පෙන්වන ප්‍රදේශයක් වන අතර පොල්ලේබැද්ද ප්‍රදේශය වර්තමානය වන විටත් ආදිවාසී ලක්ෂණ පෙන්වන ප්‍රදේශයකි. උහන ප්‍රදේශය අර්ධ නාගරික ලක්ෂණ පෙන්නුම් කරයි. මෙම තෝරාගැනිම තුළින් මල්වරචාරිත්‍ර පිළිබඳ එකිනෙකට වෙනස් වූ දත්ත රැස් කර ගැනිමට අපේක්ෂා කරනු ලැබීය. මෙම ප්‍රදේශ ත්‍රිත්වය ආශ්‍රිතව පුද්ගලයින් 52ක් සමඟ සාකච්ඡා පවත්වා අදාළ දත්ත ඒකරාශි කිරීම සිදු කරන ලදී. තවද මෙම සම්මුඛ සාකච්ඡා අතරින් පුද්ගලයින් 32 ක් සමඟ ගැඹුරු සාකච්ඡා (In-depth interviews) පවත්වනු ලැබිය. ඊට අමතරව වරකට දෙදෙනා, තිදෙනා බැගින්වූ කුඩා කණ්ඩායම් මුල්කර ගත් ඉලක්ක ගත සකච්ඡා (Focus Group Discussions) පවත්වනු ලැබීය. සම්මුඛ සාකච්ඡා සඳහා යොදා ගත් ප්‍රශ්න තේමාවට අදාළව පෙර සැලසුම් කරන ලද (Semi- Structured) ඒවාය. සම්මුඛ සාකච්ඡා අතරතුර යම් යම් කරුණු තවදුරටත් එකතු කර ගැනීම සඳහා හරස් ප්‍රශ්න (Cross-Cutting Questions) අසනු ලැබීය. තේමාවට අදාළව කරුණු රැස් කර ගනු ලැබීය. අවසාන වශයෙන් නිරික්ෂණ ක්‍රමවේදය යටතේ තොරතුරු එක් රැස්කිරිම සිදුකරනු ලැබිය. ක්ෂේත්‍ර අධ්‍යයනයේදී රැස්කර ගත් දත්ත ක්ෂේත්‍ර සටහන් වශයෙන් සහ ශ්‍රව්‍ය පටිගත කිරීම් වශයෙන් ඒකරාශී කරගනු ලැබීය. අනතුරුව අදාළ දත්ත පර්යේෂණ අරමුණ සමග සමපාත වන ආකාරයෙන් කේතකරණය හා වර්ගීකරණය කරනු ලැබීය. අදාළ දත්ත වෙන් කර ගැනීමෙන් අනතුරුව තේමාත්මක විශ්ලේෂණ ක්‍රමය (Thematic Analysis Method) පදනම් කරගෙන විශ්ලේෂණය කර අදාළ නිගමනවලට එළඹෙනු ලැබුණි.


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

## 3. ප්‍රතිඵල හා සාකච්ඡාව

### 3.1. අම්පාර දිස්ත්‍රික්කයේ පදියතලාව ප්‍රදේශයේ චාරිත්‍ර

අම්පාර දිස්ත්‍රික්කයේ මායිමේ පිහිටා තිබෙන ගම්මානයක් ලෙස පදියතලාව ප්‍රදේශය හඳුනාගත හැකිය. මෙම ප්‍රදේශයටම ආවේණික මල්වර සිරිත් විරිත් රාශියක් දක්නට ලැබේ. පදියතලාව ප්‍රදේශයේ දියණියක් මල්වරවීමට පෙර සිටම මව හා දියණිය යන දෙදෙනාම ඒ පිළිබඳව දැනුවත්භාවයකින් සිටිය යුතුය. මල්වරවීමට ආසන්න දැරියකගෙන් මවට හා පියාට වස්වැදීමක් සිදු වන බවට එම ප්‍රදේශයේ ගැමියන් විශ්වාස කරයි (අප්පුහාමි, 2022). එනම්, මල්වරවීමට ආසන්නයේ සිටින දියණියක් උදෑසන අවදි වූ විගස මුලින්ම මවගේ මුහුණ දැකී මෙන් මවට වස් වැදීමක් සිදුවන බවත් ඇය මුලින්ම කිරි ගසක් දෙස බැලීමෙන් යහපතක් සිදුවන බවත් ඔවුන් විශ්වාස කරයි. මල්වර වූ දියණියක් මල්වර වූ බව මවට නොපවසන අතර එම ආරංචිය මවට පැවසීමෙන් මවට වස් වැදීමක් සිදුවන බව සලකනු ලබයි. මෙම විශ්වාස මූලික වශයෙන් මෙම ප්‍රදේශයටම ආවේණික ලක්ෂණ ලෙස හඳුනාගත හැකිය. ලංකාවේ නැගෙනහිර පළාතේ වුවත් අනිකුත් ප්‍රදේශ වල මෙවැනි විශ්වාස මත පදනම්ව කටයුතු කිරීම දැකගැනීම දුර්ලභය. මල්වර වූ පුවත තමාගේ සහෝදරියකට හෝ ළඟම කාන්තාවකට පැවසීම මල්වර දියණිය විසින් සිදුකරයි. ඉන් අනතුරුව මල්වර වූ දියණියව කිරි ගසක් අසලට රැගෙන යන අතර ඇයගේ ආරක්ෂාව වෙනුවෙන් යකඩින් තැනූ දෑකැත්තක් අතට දීම සිරිතයි. මල්වර වූ මොහොතේම වස්කළය දැමීම නම් චාරිත්‍රයක් පදියතලාව ප්‍රදේශයේ ගැමියන් විසින් සිදු කරයි (අප්පුහාමි, 2022). වස් කළය දැමීම ලෙස හඳුන්වන්නේ මැටි මුට්ටියකට වතුර පුරවා එය හිස වටේ තෙවරක් කරකවා ඒ අසල ඇති ගලක ගසා වස් කළය විනාශකර දැමීමයි. මෙම ක්‍රියාව සිදු කරනු ලබන්නේ දියණියගේ නැන්දා කෙනෙකු විසිනි. ඉන් අනතුරුව දියණියගේ වස්දොස් දුරු වී යන බව විශ්වාස කරන අතර පසුව මවගේ මුහුණ දැකීමට දියණියට අවස්ථාව සැලසෙයි. වස්කලය දැමීමෙන් අනතුරුව සුදු රෙද්දකින් මුහුණ වසාගෙන දියණියව නිවසේ පිටුපස දොරටුවෙන් ඇගේ කාමරයට රැගෙන පැමිණෙයි. ඉන් අනතුරුව මව, නැන්දනිය හා තවත් කාන්තාවන් කීහිප දෙනෙකු විසින් කිරිබතක් හා හත්මාළුවක් පිළියෙල කරනු ලබයි. ඉන් පසුව පිළියෙල කරන ලද කිරිබත්වලින් කිරිබත් ගුළි හතක් සාදනු ලබයි. කිරිබත් ගුළි හත මව විසින් මල්වර දියණිය සිටින ස්ථානයට රැගෙනවිත් ඇය වෙනුවෙන් වත්පිළිවෙතක් සිදුකරයි. දියණියගේ දෑත් දෙකට එකවර කිරිබත් ගුළි දෙක බැගින් තෙවරක් ලබාදෙයි. එම කිරිබත් ගුලි දෙකෙන්ම සුළු ප්‍රමාණයක් අනුභව කොට හිස සිට දෙපතුළ දක්වාම කිරිබත් ගුලිවලින් ස්පර්ශකර තම හිසට ඉහළින් පිටුපස දෙසට විසි කිරීමට සලස්වයි. එමගින් ඇයට සෞභාග්‍ය උදාවන බවත් වස්දොස් දුරු වන බවත් ගැමියෝ විශ්වාස කරති. ඉන් අනතුරුව වෙනමම ඇයට කිරිබත් බෙදූ පිඟානක් සහ කිරිබත් ගුලි හතෙන් ඉතිරි වූ කිරිබත් ගුලියත් හත්මාළුව සමඟ අනුභව කිරීමට ලබාදෙයි. ඉන් අනතුරුව ස්නානය කරන දින දක්වාම දියණියට නියමිත වූ කාමරයේ රැදී සිටිය යුතුය (සිරියාවතී, 2022). මෙම සියලුම චාරිත්‍ර පදියතලාව ප්‍රදේශයටම අනන්‍ය වූ ඒවා වීම විශේෂය.



**ඡායාරූපය 1. පදියතලාව ප්‍රදේශයේ වස්කළය බිඳීම සිදු කරන ආකාරය**


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk


පදියතලාව ප්‍රදේශයේ මල්වර වූ දින මෙන්ම මල්වර වූ දින සිට ස්නානය කරන දින දක්වා අතීතයේ පටන් මේ දක්වාම මල්වර චාරිත්‍ර වාරිත්‍ර බොහෝමයක් සිදු කරයි. මුල්ම චාරිත්‍රය ලෙස මල්වර දියණියට ස්නානයට සුදුසු නැකතක් සාදා ගැනීම සිදු කරයි. දියණියගේ පියා විසින් නැකැත්කරු හමුවට ගොස් නියමිත සුබ වේලාවක් බලවාගෙන පැමිණෙයි. එහි දී නැකැත්කරු විසින් දියණිය මල්වර වූ වේලාව, මල්වර වූ ස්ථානය හා ලග්න පලාපල ආදිය සැලකිල්ලට ගනිමින් ඇයට සුදුසු සුබ වේලාවක් සකසා දෙනු ලබයි. එමෙන්ම එම නැකැත් පත්‍රය තුළ ස්නානය කරන දින මල්වර වූ දියණියට ඇඳීමට හා පැළඳීමට සුදුසු වස්ත්‍රවල වර්ණ ආදිය ද සඳහන් කරයි. පදියතලාවේ ප්‍රජාව විසින් එම නැකැත්කරුවාගෙන්ම දියණියගේ මල්වර කේන්ද්‍රය සැකසීමද සිදු කරයි. මෙම කාලයේ දී දියණියට පිරිමි පාර්ශවය ඇස ගැටීමට නොතබන අතර ඇය ආරක්ෂිතව කාමරයක රඳවා තබයි. ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රදේශවල දී මල්වර වූ සමයේ දී එනම්, දියණිය ස්නානය කිරීමට පෙර නිවස තුළ රඳවා තබන කාලයේ දී මස් මාළු ආදී ආහාර අනුභවයට අවසර නොදෙයි.

නමුත් පදියතලාව ප්‍රදේශයේ දී ඒ දේවල් සැලකිල්ලට නොගන්නා බවක් හඳුනාගත හැකිවිය. එනම් ඔවුන් දියණියගේ පෝෂණ තත්ත්වය මත දියණියට ඕනෑම ආහාර පාන වර්ගයක් ලබාදීමට යුහුසුලුව කටයුතු කරයි. එමෙන්ම ස්නානය කරන මොහොත දක්වාම දියණියට දෑකැත්තක් වැනි යකඩ කැබැල්ලක් ආරක්ෂාව වෙනුවෙන් ලබාදෙයි. යකඩ ආයුධයක් දියණිය අසල තබනුයේ දියණියට යක්ෂ ප්‍රේත ඇල්ම බැල්ම වැටේයැයි යන බියෙන් දියණියගේ ආරක්ෂාව උදෙසායි. සැමවිටම දියණිය අසල කාන්තාවක් සිටින අතර කිසිවිටකත් ඇයව තනි නොකරනු ලබයි. මල්වර නැකතට අනුව නැකැත්කරු විසින් පවසන ලද ආකාරයට දියණියගේ මල්වර උත්සවය සඳහා ඇඳුම් පැළඳුම් රැගෙන එනු ලබයි. ඒ අතරම මල්වර දිනට ගැනීමට අවශ්‍ය ආහාරපාන මව ඇතුළු තවත් කාන්තාවන් කිහිපදෙනෙකු විසින් මල්වර උත්සවයට පෙර දින සිට සකසනු ලබයි. මල්වර වූ දියණිය ස්නානයට පෙර කාමරයක රඳවා තබන දින කිහිපයේ දී ඇයට ඇඳුම් පැළඳුම් ඉවත් කිරීමට, කොණ්ඩය පීරීමට නියපොතු කැපීමට තහනම් විය. එමෙන්ම ස්නානය කරන දිනට පෙර කණ්නාඩියෙන් මුහුණ බැලීමද සිදු නොකළ යුතුය. තමාට නියමිත වූ කාමරයෙන් පිටත නිවසේ කිසිදු ස්ථානයකට ගමන් නොකළ යුතු අතර ආහාර පාන ආදී සියල්ල කාන්තාවක් විසින් හෝ මව විසින් දියණියගේ අසලටම ගෙනවිත් දෙයි. එමෙන්ම මල්වර සිරිතට අනුව මල්වර උත්සවය දින දියණියට ස්නානය කිරීමට මල්වර ඖෂධ පැකැට්ටුව සමගින් ඖෂධවලින් යුතු වතුර බේසමක් සාදා තැබීම පෙර දිනයේ දී සිදු කරයි. ඉන් අනතුරුව මල්වර උත්සව දිනට අවශ්‍ය සියලු දේවල් පිළියෙල කිරීමද ඊට පෙර දිනයේ දී සිදුකරනු ලබයි (කුලරත්න, 2022).

මල්වර වී දින කිහිපයක් නිවසට වී සිටි දියණියගේ අවසාන මල්වර චාරිත්‍රය ස්නානය කරන දිනයේ දී සිදු කරනු ලබයි. මෙදින සිදු කරන මුල්ම චාරිත්‍රය වන්නේ නැකතට අනුව ස්නානය කිරීමයි. බොහෝවිට නැකත යෙදෙන්නේ උදේ කාලයේ දී හෝ හිමිදිරියේදීය. එහි දී නැකැත්කරු විසින් සකසා දෙන ලද සුබ නැකතට අනුව ස්නාන කටයුතු සිදු කරනු ලබයි. දියණිය ස්නානය කරවනු ලබන්නේ ඇය මල්වර වූ මොහොතේ වස්කලය දැමීමට එක් වූ නැන්දනිය සමගිනි. ස්නානය කිරීමට සුබ දිශාවක්ද ඇත. මුලින්ම සුබ දිශාවට අනුව ඖෂධ මුට්ටිය සහිත වතුර භාජනය හිසේ සිට දෙපතුල දක්වා වත්කරනු ලබයි. ස්නානය සිදු කරවනු ලබන්නේ හතර දෙසින් වටකරනු ලැබූ එළිමහන් ස්ථානයක දී ය. දියණිය හැඳ සිටි වස්ත්‍ර සියල්ල ඉවත් කළ යුතුය. එම වස්ත්‍ර නැවත ප්‍රයෝජනය සඳහා නිවසට ගනු ලබන්නේ නැත. එමෙන්ම දියණිය මල්වර වී සිටි කාලයේ ප්‍රයෝජනයට ගත් සියල්ලම ඉවත් කරනු ලබයි. ස්නානය කරන ස්ථානයේ දීම දියණියට නියමිත වර්ණ අනුව ඇඳුම් පැළඳුම් ඇන්දවීම ද සිදු කරයි. ඉන් අනතුරුව සුදු රෙද්දකින් මුහුණ වසා නිවසෙහි ඉදිරිපස දොරටුවට දියණියව කැඳවාගෙන එනු ලබයි. මේ අවස්ථාවේ චාරිත්‍රයන් සඳහා අවශ්‍ය දේවල් නැකැත්කරු හා ඒ පිළිබඳ දන්නා ප්‍රාමාණිකයෙක් විසින් සූදානම් කර ඇත. මෙම කටයුත්ත සඳහා පුරුෂයෙකු හෝ කාන්තාවක් ආදි ඕනෑම අයෙකුට සම්බන්ධ විය හැකිය. මෙම මල්වර මෙම මල්වර සිරිතේ දී ණිඅටමගල ඇදීම" අනිවාර්ය ලක්ෂණයකි. එම ඇදීම සිදු කරනු ලබන්නේ සාලය මැද පැදුරක් එලා ඒ මතට හාල් දමා ඒ උඩින් රටාව අඳිනු ලැබීමෙනි. මෙම සුවිශේෂී චාරිත්‍රය එම ප්‍රදේශයේම පමණක් සිදු කෙරෙන අයුරු ක්ෂේත්‍ර


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

පරීක්ෂණයේ දී නිරීක්ෂණය විය. මීට අමතරව මැටි කළ දෙකක පොල් මල් දෙකක් දමා ඇත. එමෙන්ම බුලත්, පහන්, මල්, මෝල්ගහක්, කණ්ණාඩියක් ආදිය හා කහ වතුරින් තනන ලද දියර වර්ගයක් තබා ඇත. මෙහි දී දියණිය නිවසට ඇතුළුවීමට පෙර කාන්තාවන් විසින් හා නැකැත්කරු විසින් ජයමංගල ගාථා හා සෙත් පිරිත් කියනු ලබයි. සෙත් පිරිත් කියන අතරතුර කහදියර ස්වල්පයක් දියණියගේ ශරීරයට නැකැත්කරු විසින් ඉසිනු ලබයි. ඒ සියලු චාරිත්‍රවලින් අනතුරුව නියමිත රටාවකට අනුව ඇඳි අටමගල හා ඒ ඉදිරිපසින් දමා ඇති මෝල්ගහ උඩින් පැන නිවසට ඇතුළු වීමට සලස්වයි.



**ඡායාරූපය 2. චාරිත්‍රවල දී අටමගල දක්වන ආකාරය**

නිවසට ඇතුළුවන මොහොතේ දී දියණියගේ මාමා කෙනෙකු විසින් පොල් ගෙඩියක් බිඳීම සිදුකරනු ලබයි. මෙය සිදුකරනු ලබන්නේ දියණියගේ වස්දොස් දුරුවීම මූලික කරගෙනය. එමෙන්ම පොල් ගෙඩිය බිඳීගිය ආකාරයෙන් මෙම ගැමි ජනතාව පලාපල විස්තර පැවසීම ද සිදු කරයි. නිවසට ඇතුළු වන විට මව හා පියා විසින් මල් දැමූ වතුර භාජනයක් තබා ගෙන දියණියව පිළිගැනීමට ඉදිරිපසින් සිටිනු ලබයි. ඉන් අනතුරුව එම ජල බඳුන දියණියට පානය කිරීමට සලස්වන අතර පසුව දියණියට රත්තරන් භාණ්ඩ ආදිය පැළඳීම සිදු කරනු ලබයි (සිරියාවතී, 2022). ඉන් අනතුරුව මල්වර සිරිතට අනුව මල්වර කෑම මේසය වෙත පැමිණ සිටින සියලු දෙනා එක්රොක් වෙයි. එහිදී දියණියගේ ජීවිතයට අවශ්‍ය අනුශාසනා ලබාදීමට වැඩිහිටියන් කටයුතු කරයි. ඉන් අනතුරුව දෙමව්පියන් විසින් දියණියට කිරිබත් හා රසකැවිලි කවනු ලබන අතර ඉන් අනතුරුව අනෙකුත් සියල්ලෝම රසකැවිලි අනුභව කරති. අවසානයේ දී සියල්ලෝම ආහාර අනුභව කර සතුටුසාමීචියේ යෙදෙන අතර අවසානයේ දී දියණියට තෑගි බෝග ලබා දී සියල්ලෝම පිටව යති. එමෙන්ම මේ කාලයේ දී දියණියට දින තුනක් යනතුරු සවස් කාලයේ දී නිවසින් පිටතට යාමට අවසර නොදෙයි. එමෙන්ම මාස තුනක් යනතුරු ඇයව නිවසෙහි තනි නොකරයි (රත්නායක, 2022). අස්පර්ශනීය උරුමයන් පිළිබඳ සාකච්ඡා කරන ප්‍රජාව පදනම් කරගත් විද්‍යාත්මක ප්‍රවේශයන් (Community Based Approaches) මෙම උරුමයන් පරපුරෙන් පරපුරට ආරක්ෂා කිරීම සම්බන්ධව එකී සමාජයෙහි ප්‍රජාවට ඇති වගකීම පෙන්වා දී තිබේ. ඒ අනුව පදියතලාව ප්‍රදේශයෙහි මල්වර චාරිත්‍ර සම්බන්ධ සෑම කටයුත්තකදීම එම දැරියගේ ඥාති ප්‍රජාවගේ දායකත්වය මැනවින් දෘශ්‍යමානය. මෙවැනි කාර්යයන් පිළිබඳ හසල දැනුමක් ඇති වැඩිහිටි ප්‍රජාව මෙහිදී මූලිකත්වය ගෙන තිබේ. චාරිත්‍ර පිළිබඳව ඔවුන් එකිනෙකා සාකච්ඡා කරමින් කිසිදු වැරදීමකින් තොරව ඒවා අකුරටම ක්‍රියාත්මක කිරීමට ගන්නා වෑයම හොඳින්ම ප්‍රකට වේ. මෙහිදී වැඩිවියට පත් වූ අවස්ථාවේ සිටම පවුල තුළ තමන්ට ඇති සුවිශේෂිත ස්ථානයත්, සමාජය තුළ තමන් හුදකලා චරිතයක් නොවන වගත් හැඟීම දැරිය තුළ ඇතිවනු ලැබේ. එය සමාජ විද්‍යාත්මක වශයෙන් ඇයට ලැබෙන ධනාත්මක ප්‍රවේශයකි.



**ඡායාරූපය 3. පදියතලාව ප්‍රදේශයේ මල්වර චාරිත්‍ර සඳහා දැරියගේ ඥාතීන්ගේ දායකත්වය**


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

### 3.2. අම්පාර දිස්ත්‍රික්කයේ පොල්ලෙබැද්ද ප්‍රදේශයේ චාරිත්‍ර

අම්පාර දිස්ත්‍රික්කයේ පිහිටා තිබෙන පොල්ලෙබැද්ද ප්‍රදේශය ආදිවාසීන් බහුලව ජීවත්වන ප්‍රදේශයකි. එමෙන්ම ආදිවාසීන් මෙන්ම සාමාන්‍ය ජනතාව ද මෙහි වාසය කරයි. මෙම දෙපිරිසටම ඔවුනොවුන්ට ආවේණික චාරිත්‍ර තිබේ. පොල්ලෙබැද්ද ප්‍රදේශයේ දියණියක් මල්වර වූ වහාම ඒ බව තම මවට දැනුම් දෙයි. නිවසෙහි එක් මුල්ලක දියණියව තබන අතර එය තිර රෙදිවලින් වට කරනු ලබයි. ආදිවාසී ජනතාව අවි ආයුධ දෙවියන් මෙන් සලකන බැවින් දියණියගේ ආරක්ෂාවට යකඩ ආයුධයක් ලබාදෙයි. බොහෝවිට ගිරයක් වැනි ආයුධයක් මේ සඳහා යොදා ගනියි. දියණිය නිවසට කිරීම "ගෙට කිරීම" යන නමින්ම ආදිවාසී ජනතාව හඳුන්වයි. කිලි මුට්ටිය නමින් හඳුන්වන මුට්ටියක් ද මල්වර චාරිත්‍රයේ දී ඔවුන් සිදු කරයි(ජයතිලක, එම: 53). මල්වර වූ දියණිය හැඳ සිටි ඇඳුම් මුට්ටියකට දමා දියණියගේ හිසෙහි උකුණන් සිටින්නේ නම් ඉන් එක් අයෙකු රැගෙන ඒ මුට්ටියටම දමා වසා දියණිය සිටින අසලින් තබයි. අලුත් ඇඳුම් ඇඳීමට සලස්වයි. මෙසේ උකුණන් දැමීම මගින් උකුණන් වඳ වී යන බව ඔවුන්ගේ විශ්වාසයක්ව පවතී (දයාවංශ, 2022). මෙම චාරිත්‍රය මේ ප්‍රදේශයටම පමණක් සුවිශේෂ වූ බව නිරීක්ෂණය විය. මල්වර දියණියව නිවසේ තබන විට ඇය අසලින් කාන්තාවක් තැබීම අනිවාර්ය කරයි. එනම් ඔවුන් යක්ෂ හා ප්‍රේත ආභාෂයන් තදින්ම විශ්වාස කරන පිරිසකි. මල්වරයෙන් රුධිරය පිටවීමක් සිදුවන බැවින් රුධිරය මූලික කරගෙන යක්ෂයන්ගේ බැල්ම වැටෙන බව ආදිවාසී ජනතාව විශ්වාස කරයි. දියණියට තැම්බුම් හොදි ආදි ආහාර අනුභව කිරීමට ලබාදෙයි (කුමාරිහාමි, 2022).

පොල්ලෙබැද්ද ප්‍රදේශයේ ජනතාවගේ මල්වර දින සිට ස්නානය කරන දින දක්වා ද චාරිත්‍ර කීපයක් පවතී. අතීතයේ සේම වර්තමානයේ දී පොල්ලෙබැද්ද ජනතාව යම් තාක් දුරකට නැකැත් පිළිබඳ අවධානයක් යොමු කරන බව අධ්‍යයනයේ දී හඳුනාගත හැකි විය. මව හා තවත් කාන්තාවන් පිරිසක් විසින් මල්වර වූ දිනයට පසු දිනයේ දී නැකැත් බැලීමට පිටවනු ලැබේ. මෙහි දී බොහෝ විට මෙම ජනතාව දියණියගේ මල්වර වෙලාව අනුව සුබ අසුබ පල ඇතිවන බව විශ්වාස කරයි. මල්වර වේලාව අසුබ වුවහොත් ඔවුන් බොහෝ සේ කලබලවන බව දක්නට ලැබේ. ඒ අවස්ථාවේ දී අනෙකුත් දියණියන්ට වඩා විශේෂ ආරක්ෂාවක් එම දැරියට ලබාදීමට කටයුතු කරයි. මේ කාලයේ දී තැම්බුම් හොදි, පතෝල, වැටකොළු ආදී ආහාර ලබාදෙන අතර මස්, මාළු, බිත්තර ආදී ආහාර ලබා නොදෙයි. ඒවා කිලි සහිත ආහාර වශයෙන් ඔවුන් විශ්වාස කරයි. එමෙන්ම මෙම ජනතාව මල්වර වූ දියණිය සිටින ස්ථානය වටකොට නූලක් ඇද තබන ආකාරයත් දක්නට ලැබුණි (රත්නායක, 2022). එහි දී ඔවුන් ඇයගේ ආරක්ෂාව පතා මෙය සිදු කරන බව හඳුනාගත හැකිවිය. දැරියට මෙම කාල සීමාවේදී කන්නාඩියෙන් මූණ බැලීම, නියපොතු කැපීම ආදී ක්‍රියා සදහා ඉඩ ලබා නොදෙයි. එමෙන්ම කිසිදු පුරුෂයකුට ඇයව දැකීමට නොහැකිය. බොහෝවිට දියණියගේ මව නිවසෙහි නොමැති අවස්ථාවක ඇයගේ සහෝදරියක් හෝ බාල දියණියක් මල්වර දියණිය අසලින් තැබීම සිරිත වේ. එය දියනියගේ ආරක්ෂාව පෙරදැරි කරගෙන සිදුවන්නකි. දියණිය ස්නානය කිරීමට පෙර දිනයේ දී ඔවුන් ඖෂධ මුට්ටියක් සකසා ගනියි. එයට සුදුහඳුන් පොතු, කොහොඹ පොතු, කස්තුරි කහ ආදී ඖෂධ රාශියක් එක් කරයි. මෙයින් දියණියගේ විෂබීජ දුරුකර වස්දොස් දුරුකර ඇයගේ ආරක්ෂාව වෙනුවෙන් සෙත සැලසෙන බව විශ්වාස කරයි. මල්වර මඟුල පැවැත්වීමට පෙර දිනයේ දී මල්වර දියණියගේ නිවස උත්සවශ්‍රියක් ගන්නා බවක් පෙනේ. එනම් එයට හේතුව ඇගේ පවුලේ සියලු දෙනා එක්ව ඔවුන්ටම ආවේණික රසකැවිලි පිළියෙල කිරීම සිදු කරනුයේ මේ දිනයේදී ය, නමුත් මල්වර උත්සවයට පෙර දිනයේ දී මල්වර දියණියට කිසිදු රසකැවිල්ලක් අනුභව කිරීමට අවස්ථාවක් නැත. ඇය ස්නානය කර නැකතට අනුව ආහාර අනුභව කළ යුතු විය. එය පොල්ලෙබැද්ද ප්‍රදේශයේ ජනතාවටම ආවේණික වූවක් ලෙස ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී හඳුනාගත හැකි විය (සිරිමාන්න, 2022).

පොල්ලෙබැද්ද ප්‍රදේශයේ ජනතාව මල්වර දියණියව ස්නානය කරවනු ලබන්නේ නැකතට අනුව චාරිත්‍රානුකූලවය. ඇයව ස්නානය කරවනු ලබන්නේ දියණියගේ මව විසින්ම ය. ඔවුන්ගේ විශ්වාසය වන්නේ මව තරම් සමීපතයකු දියණියකට නොමැති බවයි. මෙහි දී මුලින්ම ඖෂධ දමන ලද ජල බඳුන දියණියගේ හිසට වක් කරයි. නිවසේ තැන්පත් කරන ලද කිලි මුට්ටිය දියණියව නහවන අවස්ථාවේ දී ගෙයින් පිටතට ගෙන වළලනු ලැබේ. එසේම වස්කළය දැමීම සිදු කරන්නේ


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

දියණියව ස්නානය කරන මොහොතේදීය. දියණිය ස්නානයට යොදා ගන්නා ලද මැටි බඳුන ගලක ගසා බිඳ දැමීම මව විසින් කරනු ලබයි. එමෙන්ම දියණිය ස්නානය කරනු ලබන්නේද කිරි ගසක් අසලය. ස්නානයෙන් අනතුරුව කිරි ගසට ආයුධයකින් හත්වරක් ඇනීමට සලස්වයි. කිරි ගසකට කෙටීම තුළින් දැරියගේ අනාගතය සෞභාග්‍යමත් කර ගැනීමට බලාපොරොත්තු වේ (සිරිමාන්න, 2022).



**ඡායාරූපය 4. පොල්ලෙබැද්දේ කොටහළු චාරිත්‍රයක් ලෙස කිරි ගහට කෙටීම සිදුකරන ආකාරය**

ස්නානයෙන් අනතුරුව හිසට සුදු සළුවක් ආවරණය කර නිවසෙහි පිටුපස දොරෙන් දියණියව ඇතුළට ගෙන එනු ලබයි. දියණිය නිවසට ඇතුළුවන මොහොතේ ඇයගේ මස්සිනා විසින් පොල් ගෙඩිය බිඳිනු ලබයි. අතීතයේ මෙන්ම වර්තමානයේ දී ද ඇතැම්විට මල්වර දියණියගේ විවාහය මස්සිනා සමග සිදුකරයි. මෙම සම්බන්ධතාව නිසා මෙම චාරිත්‍රය සිදු කිරීමට මස්සිනාට අවස්ථාව ලබා දී ඇති බව පෙනී යයි. වර්තමානයේදී ද මෙම චාරිත්‍රය ඉතා සුළු වශයෙන් සිදු වන අතර බොහෝ විට මල්වර දියණියගේ මල්වර වේලාව අසුබ වූ විට මෙය සිදු කරයි. ස්නානයෙන් අනතුරුව මංගල සිරිතට අනුව දියණිය ඇඳුම් හා වස්ත්‍රාභරණවලින් සරසයි. නිවසට ඇතුළු වූ වහාම කොරහකට ජල බඳුනක් පුරවා එයින් දියණියට ප්‍රථම වතාවට මුහුණ බැලීමට අවස්ථාව ලබාදෙයි. සාලයේ පැදුරක් දමා එහි හාල්, පොල්, බුලත්, කැවිලි හතක්, එළවළු වර්ග හතක්, හවරියක්, පනාවක, බෙහෙත් වර්ග හතක්, මී පැණි, පොල් ගෙඩියක් ආදී බොහෝ ද්‍රව්‍ය ප්‍රමාණයක් තබා ඇත. ඉන් අනතුරුව මෙම පැදුර අසලින් දියණියව ඉන්දවා රස කැවිලි වර්ග හතෙන් එක බැගින් ආහාරයට ගන්නා ලෙස පවසනු ලබයි. ඉන් අනතුරුව ආහාර ලබා ගත් දියණිය පළමුවරට නිවෙසින් පිටවීමේ නැකතක් තිබේ. එය ආදිවාසී ජනතාව හඳුන්වන්නේ වැට පැණීමේ චාරිත්‍රය වශයෙනි. නිවසෙහි පාර අසල ලී වලින් වැටක් තනා ඇත. සියලු චාරිත්‍ර අවසන් කළ දියණිය මැටි මුට්ටියකට කිරි කළයක් ගෙන කාන්තාවන් පිරිසක් සමඟ අසල තිබෙන වැවකට ගොස් කිරි කළය හලා වැවෙන් වතුර බඳුනක් රැගෙන නැවත නිවසට පැමිණෙයි. රැගෙන ආ වතුර බඳුන ගසකට දමනු ලබයි. මෙය සශ්‍රීකත්වයේ සංකේතයක් ලෙස පොල්ලේබැද්දේ ජනතාව විශ්වාස කරයි (දයාවංශ, 2022). මින් අනතුරුව උත්සවයට සහභාගීවන සියලුම ඥාති හිතවතුන් දියණියට තෑගිබෝග ලබාදීමෙන් අනතුරුව පිටව යයි. එමෙන්ම ආදිවාසී ජනතාව තුළ අතීතයේ පටන් පැවති කොටහළු යාගය නම් චාරිත්‍ර වර්තමාන සමාජයේ ද ඉතාම අල්ප වශයෙන් පවතින බව හඳුනාගන්නට ලැබුණි. එනම් අතීතයේ මෙන් නොව ඉතා සුළු වශයෙන් යාග ක්‍රමයක් මෙහි දී පවත්වයි. එය බොහෝ විට සිදු කරනු ලබන්නේ දියණියගේ මල්වර නැකත අශුභ වූ අවස්ථාවලදීය. දියණියගේ දෝෂ අවම කරමින් ඇයගේ අනාගතය යහපත් කිරීමේ අරමුණින් එම ප්‍රදේශයේ ජනතාව මෙය සිදුකරනු ලබයි. ඉන් අනතුරුව දියණියව නිවසෙහි තනි කිරීම සිදු නොකරයි. නිතිපතා ඇයට ආරක්ෂාව සලසනු ලබයි (දයාවංශ, 2022).

මීට ඉහත ද සඳහන් කළ පරිදි පොල්ලෙබැද්ද ප්‍රදේශයේ ඇති ආදිවාසි සම්භවය නිසා එහි අනිකුත් ප්‍රදේශ වලින් වෙනස් වූ යම් යම් චාරිත්‍ර හඳුනාගත හැකිය. රුධිරය, ලෝහ ආයුධ හා භූත විශ්වාසයන් සම්බන්ධව ඔවුන් දක්වා තිබූ අවධානය එහිදී කැපී පෙනේ. අස්පර්ශනීය උරුමයන් සම්බන්ධව ප්‍රජාව පදනම් කර ගත් ප්‍රවේශයන් (Community Based Approaches) පෙන්වා දෙන ආකාරයට පරපුරෙන් පරපුරට අදාළ චාරිත්‍ර හා සම්බන්ධ දැනුම බෙදාදීමේ වගකීම එම සමාජයෙහි ප්‍රජාව සතුය. මේ අනුව පොල්ලෙබැද්ද ප්‍රදේශයේ


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk



**ඡායාරූපය 5. පොල්ලෙබැද්ද ප්‍රදේශයේ චාරිත්‍රයක් පෙස වැට පැනීම සිදුකරන ආකාරය**

ජනතාව අතීත පරම්පරාවෙන් තමන්ට උරුම වූ ආදීවාසි උරුමයන් යම් පමණකට හෝ ආරක්ෂා කර ගනිමින් මතු පරම්පරාවට ද ඒවා දැක බලා ගැනීමටත්, ආරක්ෂා කර ගැනීමටත් ලබා දී ඇති අවස්ථාවන් විද්‍යමාන විය. ඒ වගේම මෙහිදී ද පදියතලාවේ මෙන්ම චාරිත්‍ර වාරිත්‍ර සිදු කිරීමේදී ඥාති මිත්‍රාදී සමූහයේ ඒකරාශී වීමත් ඒ ඔස්සේ දියණියට ලබා දෙන ආරක්ෂාකාරී හැඟීමක් පැහැදිලි විය.

### 3.3. අම්පාර දිස්ත්‍රික්කයේ උහන ප්‍රදේශයේ චාරිත්‍ර

අම්පාර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති උහන ප්‍රදේශය අර්ධ නාගරික ප්‍රදේශයක් ලෙස හඳුනාගත හැකිය. මෙම ප්‍රදේශයේ දියණියක් මල්වර වූ වහාම ඒ බව මවට දන්වා සිටියි. ඉන් අනතුරුව මව විසින් ඒ අවස්ථාවේම පිරිසිදු ජලයෙන් දියණියව ස්නානය කරනු ලබයි. මෙසේ සිදු කරනුයේ මල්වරවීම කිලි අවස්ථාවක් ලෙස සලකා විෂබීජ නැසීමේ අරමුණෙනි. ඊට පසු දිනක දී ද නැකතකට අනුව ස්නානය කරවයි. මෙය එම ප්‍රදේශයටම ආවේණික වූවකි. ඉන් අනතුරුව දියණියව කාමරයක තනි කරයි. පළමුව ස්නානය කිරීමට පෙර හැඳ සිටි වස්ත්‍ර මුට්ටියක බහා ඒ මතින් පොල් මලක් තබා පොල්මල උඩ පහනක් පත්තුකර දියණියගේ කාමරයේ තබනු ලබයි. දියණියගේ ආරක්ෂාව උදෙසා යකඩ කැබැල්ලක් ඇයගේ හිස ඉස්මත්තෙන් තබයි. එමෙන්ම නිවසේ සෑම අවස්ථාවකදීම මල්වර දැරියගේ තනියට කාන්තාවක් සිටී මල්වර වූ දියණිය මල්වර වූ මොහොතේ සිට කාමරයක තබන අතර එදින පටන් එම කාමරයෙන් ඉවත් කරන ලද කැලිකසල කිසිවක් කාමරයෙන් පිටතට රැගෙන යන්නේ නැත. ඒ සියල්ල කාමරයේම ඇති කැලිකසල බඳුනකට දමනු ලබයි. ඉන් අනතුරුව ඒ සියල්ල ඉවත් කරනු ලබන්නේ ස්නානය කරන දිනයේදීය (සිරියාවතී, 2022). උහන ප්‍රදේශයේ ද මල්වර වූ දින සිට ස්නානය කරන දින දක්වා චාරිත්‍ර බොහෝ ප්‍රමාණයක් සිදු කරයි. පළමුවන චාරිත්‍රය වන්නේ නැකැත් බැලීමට පිටත්වීමයි. උහන ප්‍රදේශයේ නැකැත් බැලීමට පිටත් වන්නේ මල්වර වී දෙවන දවසේ දී ය. නැකැත් බැලීමට පිටත් විය යුත්තේ මල්වරවී දෙකෙන් බෙදෙන දිනක වීම විශේෂ ලක්ෂණයකි. එය ඉරට්ටේ සංඛ්‍යාවක් විය යුතුබව විශ්වාස කරයි. එහි දී ඔවුන් එයින් සුබපල ගෙන දෙන බව අනුමත කරයි. මේ සඳහා නැකැතක් සකසා ගැනීමේ දී මල්වර වී දින තුනක් හතරක් ඇතුළත නැකැතක් යොදා ගැනීමට කටයුතු කරනු ලබයි. ඉතා දිගු දවස් ප්‍රමාණයක් දියණියව මල්වර කාමරයෙහි නොතබයි. නැකැත් බලන්න පිටත් වන විට එදින උදැසන කිරිබතක් පිළියෙල කර ඒවා සුදු රෙද්දකට දමා කිරිබත්වලින් මල්වර දියණියගේ ශරීරය තවයි. එම කිරිබත් ස්වල්පයක් අනුභව කිරීමට ද දෙයි. එයින් සුබපල ලැබෙන බව ජනතාව විශ්වාස කරයි. මෙම චාරිත්‍රය පර්යේෂණයට ලක් කළ ක්ෂේත්‍ර ප්‍රදේශ අතරින් මෙම ප්‍රදේශයටම ආවේණික වූවක් බව හඳුනාගත හැකි විය. මෙම කාලපරාසයේ දී මස්, මාළු, බිත්තර ආදී කිසිදු ආහාරයක් ලබා නොදෙන අතර පතෝල, වැටකොළු, කිරිහොදි ආදී ආහාර ලබාදෙයි. නියපොතු කැපීම තහනම් විය (සිරියාවතී, 2022).

මේ දිනයේ මල්වර උත්සවය පවත්වන දී මුලින් ම සිදුකරන චාරිත්‍රය වන්නේ නැකතට අනුව ස්නානය කිරීමයි. එය බොහෝවිට හිමිදිරි උදැසන යොදාගනියි. බෙහෙත් ද්‍රව්‍ය අඩංගු ජල බඳුන මුලින්ම නහවනු ලබන්නේ මව විසිනි. ඉන් අනතුරුව තවත් වතුර මුට්ටි හතක් මව විසින් නහවනු ලබන අතර පසුව දියණියගේ නැන්දනියක විසින් නහවනු ලබයි. මෙම ස්නානය සිදු කරන්නේ අඹ ගසක්, කොස් ගසක් ආදී වූ කිරි ගසක් යටය. මෙම ගස අසල පොල් අතුවලින් මඩුවක් තනා

වටකොට ආවරණය කර ඇත. මෙම ස්ථානයේදීම දියණියට ඇඳුම් ඇන්දවීම සිදුකරයි. ඉන් පසු ඉදිරිපස දොරටුවෙන් නිවසට ඇතුළු වෙයි. එසේ ඇතුළුවන විට පළමුව දියණියව පිළිගැනීමට ඉදිරිපස සිටින්නේ දියණියගේ පියා ය. පියා විසින් ඉදිරිපසින් සිටගෙන මල් දැමූ ජල බඳුනත් තබාගෙන සිටින අතර ඉන් ස්වල්පයක් දියණියට පානයට ලබා දී ඇයව ආදරෙන් පිළිගනී. මල්වර දියණිය පළමුව දකින පුරුෂයා ලෙස පියා යොදාගෙන ඇත්තේ ඇයට සමීපතම, ආදරණීයම, ළෙන්ගතුම හා නිබඳ ඇයට ආරක්ෂාව සපයන පුද්ගලයා ලෙස සමාජය විසින් අරුත්ගන්වන නිසා විය යුතු ය.



**ඡායාරූපය 6. උහන ප්‍රදේශයේ චාරිත්‍රයක් ලෙස පොල් ගෙඩිය බිඳීම**

ඉන් අනතුරුව නිවසට ඇතුළු වී පොල් ගෙඩියක් බිඳීම මල්වර වූ දියණිය විසින්ම සිදු කරයි. මෙය දියණියගේ වස් දොස් දුරු කිරීමේ අරමුණින් සිදුකරන අතර පොල් ගෙඩිය බිඳී කැලි කැඩෙන ආකාරය අනුව එම ප්‍රදේශයේ ජනතාව විවිධ ඵලාඵල දක්වති. එක් කොටසක් උඩු අතට හැරී තිබුණහොත් මල්වර දියණියට අනාගතයේ දී දරුවන් ලැබෙන විට දූවරුන් බහුලව ලැබෙන බව ඔවුන්ගේ විශ්වාසයයි. පොල් ගෙඩිය සත් අඩකට පමණ කැඩී බිඳී ගියහොත් ඇයට එය අසුබදායක බවද විශ්වාස කරයි. නිවසට ඇතුළු වූ දියණියට රත්තරන් ආභරණ පැළඳවීම පවුලේ ඥාතීන් විසින් සිද්ධ කරනු ලබයි. ඉන් අනතුරුව මඟුල් මේසය වෙත සියලු දෙනා ගොස් කාබී විනෝද වෙති. එම ප්‍රදේශයේ ජනතාව බොහෝ විට ඉතා උත්සවශ්‍රීයෙන් මෙම මංගල්‍යය සිදුකරන බව දක්නට ලැබේ (දයාවංශ, 2022).

මේ අනුව අම්පාර දිස්ත්‍රික්කයේ උහන ප්‍රදේශයේ ද සම්ප්‍රදායික මල්වර චාරිත්‍ර සැලකිය යුතු ප්‍රමාණයකින් වර්තමානයේදීත් ක්‍රියාත්මක වන බව දැකගත හැකිය. අස්පර්ශනීය උරුමයන් වශයෙන් එම චාරිත්‍ර තවත් ඉදිරියට පවත්වාගෙන යාම වෙනුවෙන් ප්‍රදේශයේ වැඩිහිටි ප්‍රජාව දක්වන උනන්දුව පැහැදිලිවම නිරීක්ෂණය විය.

### 3.4. මල්වර චාරිත්‍ර හා නූතන ප්‍රවණතා

ගැහැනු දරුවෙකු වැඩිවියට පැමිණීම අතීත සමාජයේ ඉතා වැදගත් අවස්ථාවක් ලෙස සලකා ඇත. මේ නිසාම දැරියක වැඩිවියට පැමිණීම දැනගත් මොහොතේ සිටම ඒ හා සම්බන්ධ චාරිත්‍ර චාරිත්‍ර ඉතා ඉහළින් ක්‍රියාත්මක කිරීමට ලාංකික ප්‍රජාව හුරු වී සිටි බව පැහැදිලිය. පර්යේෂණයට ලක් කරන ලද ලංකාවේ නැගෙනහිර පළාතේ ප්‍රදේශ තුනේම සැලකිය යුතු ප්‍රමාණයකින් අතීත මල්වර චාරිත්‍ර සුරක්ෂිත වී ඇති බව පැහැදිලිය. ඒවා තවදුරටත් සුරක්ෂිත කරගෙන ඉදිරි පරම්පරාවටද එම දැනුම සම්ප්‍රේෂණය වීමේ ප්‍රවණතාද එම සමාජවල දක්නට ඇත.

නමුත් මේ ප්‍රදේශවලද තවදුරටත් සම්ප්‍රදායික මල්වර චාරිත්‍ර පිළිබඳ අවධානය යොමු නොකරන ජනතාවද දක්නට ලැබුණි. උදාහරණ වශයෙන් ඔවුන් අදහස් කරනු ලැබුවේ මල්වරය යනු දැරියකගේ ශරීරයේ සිදුවන ස්වාභාවික වෙනස්වීමක් නිසා එය විශේෂ කොට සැලකීමක් අවශ්‍ය නොවන බවයි. මේ නිසා සම්පූර්ණයෙන්ම චාරිත්‍රවලින් බැහැරව කටයුතු කරන ජනකොටස් මෙම ප්‍රදේශ තුනේම ජීවත්වන බව විද්‍යමාන විය. සමහර අවස්ථාවල දැරිය මල්වර වූ බව දැන ගැනීමෙන් පසු ඇයව ස්නානය කරවා පෝෂ්‍යදායී ආහාර පාන ලබා දීමට කටයුතු කරනු ලැබේ. අතීත සිංහල ජනතාව මල්වර චාරිත්‍ර සිදු නොකළොත් දැරිය විවිධ ලෙඩ රෝගවලට ගොදුරු වන බවත් අනාගතයේ විවිධ කරදරවලට මුහුණ දීමට ඉඩ ඇති බවටත් විශ්වාස කරනු ලැබීය. නමුත් මල්වර චාරිත්‍ර අතහැර දමා ඇති ජනතාව එවැනි විශ්වාස විද්‍යාත්මකභාවයකින් තොර


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

සම්ප්‍රදායික මතිමතාන්තර පමණක් බව පෙන්වා දෙනු ලැබුණි.

අතීතයේදී මල්වර වූ දියණිය නොකළ යුතු ක්‍රියා බොහෝ තිබුණ ද වර්තමානයේ දී එකී තහංචි හා සම්මතයන් පිළිබඳව එතරම්ම තැකීමක් සිදු නොකරන අවස්ථා නිරීක්ෂණය විය. එනම් මල්වර වූ දියණියක් ස්නානය කරවන දින දක්වා නියපොතු කැපීම, කොණ්ඩය පීරීම, කණ්ණාඩියෙන් මුහුණ බැලීම ආදි ක්‍රියාවන් නොකළ යුතු වූවත් වර්තමානයේ දී පර්යේෂණයට ලක් කළ ප්‍රදේශ තුනේම සමහර ජනකොටස් ඒ කිසිදු දේකට තහංචි පනවන්නේ නැත. අතීතයේ මල්වර වූ දැරියට ලබාදීමට විශේෂ ආහාර පාන තිබුණද වර්තමානයේ දී ඕනෑම ආහාරයක් ලබාදීම සිදුකරන අවස්ථා ඇත. අතීතයේ දී ආරක්ෂාව පතා මල්වර දැරියට යකඩ කැබැල්ලක් අතට දී තිබුණ ද වර්තමානය වනවිට එයද සිදු නොවන අවස්ථා ඇත. ඒ වෙනුවට ඇයටම ආවේණික වූ කාමරයක තනි කිරීම පමණක් සිදු කරයි (කුලරත්න, 2022).

අතීත මිනිසුන් මල්වර සිරිත් ඉටු කරන දවසේ එනම්, මල්වර උත්සව දිනයේ තම පවුලේ ඥාති පිරිසට පමණක් තේ පැන් සංග්‍රහයක් ලබා දී ඇත. නමුත් වර්තමානයේ දී බොහෝ පිරිසකට ආරාධනා කර උත්සව ශාලාවල සාද පැවැත්වීම හා මත්පැන් සාද පැවැත්වීම දක්වා වර්ධනය වී ඇත. බොහෝවිට නාගරික පරිසරවල උත්සව සංවිධානය කරන්නේ නිවස තුළ දී නොව උත්සව ශාලා තුළදීය. මෙහිදී උත්සවය වෙනුවෙන් ආරාධනා පත්‍ර (Invitation Card) ආදියද බෙදා හැරීමක් සිදු කරයි. සිරිත් විරිත්වලට වඩා විනෝදකාමීව හා මුදල මත පදනම්ව මේ සියල්ල සිදු කිරීම දක්නට ලැබේ. මෙය විවාහ මංගල උත්සවයක් තරම් උත්සවශ්‍රීයෙන් පවත්වනු ලබන අතර ඇතැම් පළාත්වල එය දින දෙකක් තුනක් දක්වා පවත්වනු ලබයි. එමෙන්ම අතීතයේ මෙන් නොව වර්තමානයේ දියණියගේ ස්නානය සිදු කිරීම කරනු ලබන්නේද නානකාමර තුළදී ය. උත්සව අවස්ථාවේදී ඇයටම ආවේණික වූ ඡායාරූප මුසුවක් (Photos Shoot) එළිදැක්වීම දක්නට ලැබේ. ඒ දේවල් අන්තර්ජාලය ඔස්සේ ද පළකිරීමට ඔවුන් කටයුතු කරයි (කුලරත්න, 2022). අතීතයේ දී මල්වර වූ දින සිට ස්නානය කරන දින දක්වාම මල්වර දියණිය එකම වස්ත්‍රයක් හැඳ සිටිය යුතු වුවද වර්තමානයේ දී දිනෙන් දිනට මාරු කිරීමක් දක්නට ලැබේ. වර්තමානයේ දී උත්සවයට ඇඳීමට පැළඳීමට වෙනමම ඇඳුම් පැළඳුම් වෙළඳ ශාලාවලද දක්නට ලැබේ. මේ සියල්ල වර්තමානයේ දී සිදු කරනු ලබන්නේ බොහෝ විට මුදල මත පදනම්වය. එනම් උත්සවයක් පැවැත්වීම අරමුණු කරගෙන ඊට සාපේක්ෂව දියණියට මුදල් ත්‍යාග ලැබීම මත මේ සියල්ල සිදු කරන බව අධ්‍යයනයේ දී හඳුනාගත හැකිය. මේ නිසා වර්තමානය වන විට මල්වර චාරිත්‍ර හා බැඳුණු සාම්ප්‍රදායික හා ගෞරවනීය බව වෙනුවට ඒ තුළට නවීකරණ ලක්ෂණ ආරෝපණය වී ඇති බව පැහැදිලිය. මල්වර චාරිත්‍ර පිළිබඳව සම්ප්‍රදායෙන් ඔබ්බට සිතීමටත් ක්‍රියා කිරීමටත් මෙම ප්‍රදේශවල සමහර ජනකොටස් පෙළඹීමේ ප්‍රවණතාවයක් විද්‍යමාන විය (කුලරත්න, 2022).

## 4. සමාලෝචනය

ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ අම්පාර දිස්ත්‍රික්කය තවමත් දැඩි නාගරීකරණයකට හෝ නවීකරණයකට බඳුන් නොවූ ප්‍රදේශයකි. මේ නිසා මල්වර චාරිත්‍ර මුල්කර ගත් අස්පර්ශනීය උරුමයන් මේ ප්‍රදේශයේ බොහෝ දුරට සුරක්ෂිතව පවතී. පර්යේෂණයට ලක් වූ ප්‍රදේශ තුනෙහිම ජන ප්‍රජාව බහුතරයක් මල්වර චාරිත්‍ර ආරක්ෂා කර ගැනීමටත් මතු පරම්පරාවන්ට එම දැනුම සම්ප්‍රේෂණය කිරීමටත් දැඩි කැමැත්තක් දක්වනු ලැබේ. අම්පාර දිස්ත්‍රික්කයේ පදියතලාව, පොල්ලෙබැද්ද හා උහන යන ප්‍රදේශ තුනෙහිම මල්වර චාරිත්‍ර මුල්කර ගත් ක්‍රියාකාරකම්වල පොදුවේ සමානකම් දෘශ්‍යමාන වේ. ඒ අතරම එකිනෙක ප්‍රදේශවලටම ආවේණික සුවිශේෂතාද නිරීක්ෂණය වේ. මීට අමතරව මේ ප්‍රදේශ තුනෙහිම මල්වර චාරිත්‍රවලට විවිධ නවීන අංග ලක්ෂණ එක්වෙමින් විවිධ වෙනස්කම්වලට ලක්වෙමින් පවතින ප්‍රවණතා ද දෘශ්‍යමාන වේ.

## ආශ්‍රිත මූලාශ්‍රය


- කළුතන්තිරි, ජී. (2018). මල්වර නැකත. නුගේගොඩ: සී/ස සරසවි ප්‍රකාශකයෝ.
- ජයතිලක, වයි.ඩී. (2011). ආදිවාසී සමාජය. පන්නිපිටිය: කර්තෘ ප්‍රකාශනයකි.
- ජයතිලක, වයි.ඩී සහ තවත් අය. (2021). කොටහළු යාගය. පන්නිපිටිය: කර්තෘ ප්‍රකාශනයකි.

- ජයතිලක, වයි.ඩී. (2009). ලොවවටා මල්වර සිරිත්. පන්නිපිටියඃ කර්තෘ ප්‍රකාශනයකි.
- දිසානායක, එච්. (2004). කිල්ල සහ කොටහළුව. කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.
- රත්නපාල, එන්. (2021). ජනශ්‍රැති විද්‍යාව. කොළඹඃ එස්. ගොඩගේ සහ සහෝදරයෝ.
- රත්නායක, එස්. (2007). දියණියගේ මල්වරය සුබ ද අසුබ ද. නාත්තන්ඩියඃ විශ්ව දැනුම ප්‍රකාශකයෝ.
- Devis, P. (2011). Eco museums: A Sense of Place, Continuum International Publishing Group.
- Gombrich, R, F. (1971). Precept and Practice: Traditional Buddhism in the Rural Highlands of Ceylon. Malvara and Its Historical Context, Oxford Clarendon Press.
- Hafestein, T.V. (2018). Marking Intangible Heritage: El condor Pasa and Other Stories from UNESCO, Indiana University Press.
- Jayasuriya, M. (2013). Womanly ''Acts'': 'Attaining Age' in Contemporary Sri Lankan Writing, South Asian Review, Volume, 34(3), pp. 121-131. Available at:https://doi.org/10.1080/02759527.2013.11932944
- Jayathilaka,Y.D.(2011).The Puberty Ritual of the Veddas, SAARC Culture, Samarasinghe, G.L.W (ed), Volume (2), Colombo, SAARC Cultural Centre.
- Kim, P.M. (2011). The Puberty Ritual in Sri Lanka. A Comparative Exploration of Perception and Attitudes between Buddhist and Christian, New York, Peter Lang.
- Mead, M. (2016). Coming of Age in Samoa, New York, Blue Ribbon, Books.
- Nnaemeka, O. (2005). Female Circumcision and the Politics of Knowledge: African Women in Imperialist Discourses, Westport, Praeger Publisher.
- Schmidt, R., P. (2017). Community–Based Heritage in Africa Unveiling Local Research and Development Initiatives, Routledge.
- Smith, L. (2006). Use of Heritage, London, Routledge.
- Turner, V. (1982). The Forest of Symbols Aspects of Ndembu Ritual, United Kingdom, Cornell University Press.
- Winslow, D. (1980). Rituals of First Menstruation in Sri Lanka, Man New Serious vol 15(4), pp. 603-625, Royal Anthropological Institute of Great Britain and Ireland.


**සම්මුඛ සාකච්ඡා**


- අප්පුහාමි, එච්.එම්. (2022). බී.එම්.එම්.එන්. ගුණසේකර සමඟ සංවාදය, සැප්තැම්බර් 08.
- සිරියාවතී, ආර්.එම්. (2022). බී.එම්.එම්.එන්. ගුණසේකර සමඟ සංවාදය, අගෝස්තු 23.
- කුලරත්න, සී.ඩී. (2022). බී.එම්.එම්.එන්. ගුණසේකර සමඟ සංවාදය, අගෝස්තු 23.
- දයාවංශ, සී.සී. (2022). බී.එම්.එම්.එන්. ගුණසේකර සමඟ සංවාදය, අගෝස්තු 23.
- රත්නායක, වී. (2022). බී.එම්.එම්.එන්. ගුණසේකර සමඟ සංවාදය, අගෝස්තු 08.
- කුමාරිහාමි, ඩී. (2022). බී.එම්.එම්.එන්. ගුණසේකර සමඟ සංවාදය, අගෝස්තු 08.
- රත්නායක, ආර්. (2022). බී.එම්.එම්.එන්. ගුණසේකර සමඟ සංවාදය, අගෝස්තු 08.
- සිරිමාන්න, ඩී. (2022). බී.එම්.එම්.එන්. ගුණසේකර සමඟ සංවාදය, අගෝස්තු 05.
- රත්නායක, ඩී. (2022). බී.එම්.එම්.එන්. ගුණසේකර සමඟ සංවාදය, ඔක්තෝම්බර් 05.
- සිරිමාන්න, ඩී. (2022). බී.එම්.එම්.එන්. ගුණසේකර සමඟ සංවාදය, අගෝස්තු 05.



JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk